# NDDCB
# NEWS LETTER

## VOLUME 40
APRIL TO JUNE





NATIONAL DANGEROUS DRUGS CONTROL BOARD
MINISTRY OF PUBLIC SECURITY

## Vision

" Build a Drug Free Healthy and Secured Nation"

## දැක්ම

"මත්ද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

## Mission

"Provide leadership to ensure healthy live and peaceful society free from drug abuse through develop and effective implementation of National policy, by empowering of all related agencies, community and individuals"

## මෙහෙවර

"අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම"


**ලිපිනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
නො. 383,
කෝට්ටේ පාර,
රාජගිරිය.

**Tel – 011 2868794 – 6**

**Fax – 0112 868792 - 1**

**Email – mail@nddcb.gov.lk**

**FB – National Dangerous Drug Control Board**


**සැකසුම**

- හඳා හේරත්
- තිළිණ ප්‍රියංකර

**සෝදුපත් බැලීම**

හිරුණි වත්සලා



# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත යටතේ ස්ථාපනය කර ඇත.

මත්ද්‍රව්‍ය අනිසි භාවිතය ජාත්‍යන්තරව පාලනය කිරීම සඳහා සකස් වූ 1961 මාදක ගණයේ මත්ද්‍රව්‍ය සඳහා වූ කේවල සම්මුතිය (Single Convention on Narcotic Drugs 1961) 1971 මනෝවර්ථක ද්‍රව්‍ය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UN Convetion on Psychotropic Substances) සහ 1988 එක්සත් ජාතීන්ගේ මාදක හා මනෝවර්ථක නීති විරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (UN Convetion Against Illicit Traffic in Narcotic Drugs and Psychotropic Substances 1988) යන ජාත්‍යන්තර සම්මුතීන් ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධ කේන්ද්‍රීය ජාතික ආයතනය වශයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කටයුතු කරනු ලබයි.

## මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

- මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා නිවාරණ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සමීක්ෂණ සහ වෛද්‍ය, සමාජ, නෛතික, ආර්ථික සහ සංස්කෘතික කාරනා සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය සම්න්ධයෙන් රසායනික විශ්ලේෂණ සිදු කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක නිර්දේශයන් ලබාදීම සහ පූර්ව රසායන ද්‍රව්‍ය පාලනය කිරීම.
- මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

**මණ්ඩලය යටතේ ක්‍රියාත්මකවන ප්‍රධාන අංශ**

- පර්යේෂණ අංශය
- ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය
- නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය
- ජාතික මාදක රසායනාගාරය
- බාහිරසේවා අංශය
- නාමෝද්දිෂ්ට හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය
- පූර්වජ රසායන අධිකාරිය

National Dangerous Drugs Control Board

# සභාපතිතුමාගේ පණිවුඩය



වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන මත්ද්‍රව්‍ය භාවිතය, ඇබ්බැහිය, ජාවාරම හා විකිණීම සම්බන්ධ අර්බුදකාරී වාතාවරණය හමුවේ මත්ද්‍රව්‍ය නිවාරණය, පාලනය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය යන ක්ෂේත්‍රයන්හි නව මානයන් විවෘත කර ගැනීමේ සාධනීය ක්‍රමවේදයක අවශ්‍යතාවය පැනනැගී ඇත. එම කටයුත්ත උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කණ්ඩායම් හැඟීමෙන් යුක්තව සිය දායකත්වය නොමසුරුව ලබා දෙමින් සිටී. විශේෂයෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව පැනනගින නව ප්‍රවණතාවන්, මෙන්ම මත්ද්‍රව්‍යයෙහි ඍජු ඉලක්ක බවට පත් විය හැකි අවධානම් කණ්ඩායම් පිළිබඳවත් යාවත්කාලීන වන තොරතුරු කෙරෙහි මණ්ඩලය නිරන්තරව සිය අවධානය යොමු කර ඇත. මණ්ඩලයේ සෑම තාක්ෂණික අංශයක්ම සිය විෂය දැනුම හා අත්දැකීම් මත පදනම් වෙමින් එම තත්වයන් ආමන්ත්‍රණය කිරීම කෙරෙහි නිවැරදි හා ක්‍රමවත් ප්‍රායෝගික වැඩපිළිවෙල සකසමින් සිය වගකීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටී. යම් ගැටලුවක් කාලය හා සමාජ තත්ත්වයන් මත වෙනස් වීම් වලට භාජනය වෙමින් එහි තීව්‍රත්වය වැඩි වෙමින් පවතින විට ගැටලුවට එරෙහිව හා ඊට විසඳුම් සෙවීමට වගකීම් දරන්නන්ද සිය කාර්යයන් ඊට අනුරූපී ලෙස සකස් කර ගත යුතු වන අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නිකුත් කරන මෙම කාර්තුමය ලේඛනයෙහි අන්තර්ගතය ඊට මනාව සාක්ෂි සපයන බව කිව යුතුය. මතින් නිදහස් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම කෙරෙහි සිය වෘත්තීය වපසරිය තුළ ඔබ දක්වන සහයෝගය පිළිබඳව කෘතඥපූර්වක වන අතරම මණ්ඩලයෙහි අරමුණු ඉටුකිරීම කෙරෙහි ඔබගේ නොමද දායකත්වය නිරන්තරවම අපේක්ෂා කරමි.

**සභාපති**

**ශාක්‍ය නානායක්කාර**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

# නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය

**මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම සහ නීති වීරෝධී ප්‍රවාහනය පිටු දැකීමේ ජාත්‍යන්තර දින සැමරුම් - 2024**

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය අපරාධ පිළිබඳ කාර්යාංශය, 1987 දෙසැම්බර් 17 42/112 යෝජනාව මගින් මත්ද්‍රව්‍ය භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය හෙවත් ලෝක මත්ද්‍රව්‍ය දිනය සෑම වසරකම ජුනි මස 26 ලෙස නම් කර ඇති අතර ඒ මගින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර ලෝකයක් සාක්ෂාත් කර ගැනිම සදහා අව්‍යශ ක්‍රියාමාර්ග වඩාත් පැහැදිලි කර ගැනිම සහ ඒ සදහා ගෝලීය සහයෝගීතාව වඩාත් හොඳින් ශක්තිමත් කර ගැනීම අපේක්ෂා කරනු ලබයි. **"සාක්ෂි සනාථ කර ඇත. නිවාරණය වෙනුවෙන් ආයෝජනය කරන්න"** ("The evidence is clear; Invest in Prevention") යන තේමාව මුල් කර ගනිමින් සමරනු ලබන මෙවර ලෝක මත්ද්‍රව්‍ය දිනය, විද්‍යානුකූල ඵලදායී මත්ද්‍රව්‍ය ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ පර්යේෂණ සිදු කිරීම ,මානව හිමිකම් සදහා ගරු කරන සමාජයක් ඇති කිරීම සහ මත්ද්‍රව්‍ය දූර්භාවිතය තුලින් ඇති වන සමාජ, ආර්ථික සහ සෞඛ්‍යමය හානීන් පිළිබඳ ගැඹුරින් අවබෝධ කර ගැනීම යන අංශයන් කෙරේ ලෝක ප්‍රජාව වෙත අවධානය යොමු කරවීම මගින් මත්ද්‍රව්‍ය දූර්භාවිත ගැටළුව සදහා සාමූහික ක්‍රියාකාරකම් සහ සාක්ෂි මත පදනම් වූ විසඳුම් තුලින් සෞඛ්‍යමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගත කිරිම සදහා ප්‍රජාව බල ගැන්වීම මෙන්ම මත්ද්‍රව්‍ය වෙළඳපොළෙන් එල්ල වන තර්ජනයන්ගෙන් ආරක්ෂා වීම සහ එහි ප්‍රතිවිපාක අවම කිරීම සදහා සහාය වීම මේ මගින් අපේක්ෂා කරනු ලබයි.

ශ්‍රී ලංකාව ද සෑම වසරකම ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම සහ නීතිවිරෝධී ප්‍රවාහනය පිටු දැකීමේ දිනය අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ මූලිකත්වයෙන් අනෙකුත් රාජ්‍ය ,රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතනවල සහභාගිත්වයෙන් සමරනු ලබන අතර 2024 වර්ෂය තුළ මෙයට අදාළ ජාතික උත්සවය දකුණු පළාත කේන්ද්‍ර කර ගනිමින් 2024 ජූලි 03 වන දින ගාල්ල ,හික්කඩුව අවෙන්රා බීච් හෝටලයෙ දී පවත්වනු ලැබීය.දකුණු පළාත් ආණ්ඩුකාර ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති සම්පත් අතුකෝරාළ මහතා,ගාල්ල දිස්ත්‍රික් ලේකම් ඩබ්.ඒ ධර්මසිරි මහතා, කොළඹ ක්‍රමය මහලේකම් වෛද්‍ය බෙන්ජමින් පී.රේස් මහතා සහ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතාගේ සහභාගිත්වයෙන් සහ දකුණු පළාතේ රාජ්‍ය,රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සහ පාසල් සිසුන්ගේ සහභාගිත්වයෙන් මෙවර ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම සහ නීතිවිරෝධී ප්‍රවාහනය පිටු දැකීමේ දිනය සමරනු ලැබීය. මේ සදහා දකුණු පළාත තෝරා ගැනීම කෙරේ බලපානු ලැබූ කාරණා කිහිපයක් පැවති අතර දකුණු පළාත සංචාරක කර්මාන්තයේ කේන්ද්‍රස්ථානයක් වීම ඉන් ප්‍රධාන කරුණකි. සංචාරක ව්‍යාපාරය තළ විවිධ අන්දමින් මත්ද්‍රව්‍ය භාවිතය හා වෙළදාම සිදු වීමත් ඒ මගින් පාසල් සිසුන් හා තරුණ කණ්ඩායම් වෙත වැඩි බලපෑමක් එල්ල වී තිබීම සහ ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රවනතාවන් පරීක්ෂා කර බැලීමේ දී බස්නාහිර පළාත හැරුනු විට මත්ද්‍රව්‍ය භාවිතය සහ අත්අඩංගම් ගැනීම් අතින් අනෙකුත් පළාත් හා සසදන කළ දකුණු පළාත සංඛ්‍යාත්මකව ඉහළින් සිටීමත් යන කාරණා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.











## මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම සහ නීති විරෝධී ප්‍රවාහනය පිටු දැකීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව දිවයින පුරා සිදු කරන ලද වැඩසටහන්

මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම සහ නීති විරෝධී ප්‍රවාහනය පිටු දැකීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් දිවයින පුරා විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි නිවාරණ වැඩසටහන් සිදු කරන ලද අතර ජනමාධ්‍ය සහ වීදි නාට්‍ය උපයෝගී කර ගනිමින් ද ප්‍රජාව වෙත නිවාරණ පණිවුඩයන් ලබා දීම සහ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය විසින් මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාරය සහ පුනරුත්ථාපනයට අදාළව සිදු කරනු ලබන සේවාවන් ප්‍රජාව වෙත සමීප කරවීම සඳහා අවශ්‍ය දැනුම හුවමාරු කිරීම ද සිදු කරන ලදී.






**මත්ද්‍රව්‍ය නිවාරණය පිලිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම.**

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන නිවාරක වැඩසටහන් අතරින් ප්‍රමුඛත්වයක් ගනු ලබන වැඩසටහන් අංශය ලෙස පාසල් ළමුන් දැනුවත් කිරීම සඳහන් කළ හැකිය. අධ්‍යාපනය යනු දැනුම, ආකල්ප සහ කුසලතා වලින් පරිපූර්ණ වූ සහ මනා පෞරුෂයකින් සහ සෞඛ්‍ය සම්පන්න බවකින් යුක්ත අනාගත පුරවැසියන් සමාජගත කිරීමේ ක්‍රියාවලියයි. වර්තමානය වන විට පාසල් පද්ධතිය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා පමුණුවන සාධකයන් රැසක් පාසල් පද්ධතිය තුළ නිර්මාණය වී ඇති අතර ඒ අතරින් දරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රධාන තැනක් ගනී. නව යොවුන් වියේ දරුවන් ජීව විද්‍යාත්මකව එම අවධිය තුළ කායික, මානසික සහ සමාජීය වශයෙන් දැනෙන වෙනසකට බඳුන් වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අත්හදාබැලීම, කුතුහලය, සමවයස් මිතුරු කණ්ඩායම්වල ඇසුර වැනි හේතුන මත විවිධ අත්දැකීම් ලබා ගැනිම සඳහා පෙළඹෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මත්ද්‍රව්‍ය සඳහා යොමු වීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ලැබෙන අතර මත්ද්‍රව්‍ය ප්‍රචාරණ ව්‍යාපාරයේ ප්‍රධාන ඉලක්කය බවට ද පත්ව ඇත.එම නිසා ඔවුන් හට නිරන්තරවම මත්ද්‍රව්‍ය නිවාරණයේ වැදගත්කම සහ එහි ගොදුරක් නොවීම සඳහා ඇති කර ගත යුතු කුසලතා සංවර්ධනය සඳහා මග පෙන්වීම් සිදු කළ යුතුය. එම නිසා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ දිවයින පුරා විසිරී සිටින කාර්ය මණ්ඩලය සාක්ෂිමත පදනම් වූ කුසලතා පාදක නිවාරණ වැඩසටහන් පාසල් ළමුන් ඉල්කක කොට ගෙන සිදු කරනු ලබයි.





**තරුණ කණ්ඩායම් පාදක කර ගත් නිවාරණ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්.**

රටක ජීවනාලිය තරුණ පරපුරයි.එසේම ඔවුන් රටේ අනාගත ශ්‍රම බලකාය වන අතර වැඩිහිටි සහ ළමා පරපුර රැකබලා ගැනීමේ වගකීම භාර ගන්නා පිරිසයි.එම නිසාම ඔවුන් ශක්තිමත් සහ සෞඛ්‍ය සම්පන්න පිරිසක් ලෙස සමාජගත වීය යුතුය.මත්ද්‍රව්‍ය නිරෝගී තරුණ පරපුරේ ශක්තිය හා ඵලදායීතාවය හීන කරයි. එම නිසාම සෑම වසරකම තරුණ කණ්ඩායම් ඉලක්ක කොට ගනිමින් ඔවුන්





ඔවුන් නිවාරණ පණිවුඩ සමාජගත කරන
නියමුවන් ලෙස පුහුණු කිරීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සිදු කරනු ලබන අතර ඒ හා සමගාමීව තරුණ පිරිස් රැඳී සිටින වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, යොවුන් සේනාංක,වෘත්තීය තාක්ෂණ ආයතන සහ ජාතික තරුණ සේවා සභාව ඉලක්ක කොට ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි.





.

මීට අමතරව වැඩබිම් පාදක නිවාරණ වැඩසටහන් යටතේ විවිධ ආයතනයන්හි නිළධාරීන් ඉලක්ක කොට ගත් මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීම් දීපව්‍යාප්තව සිදු කරනු ලබන අතර ඒ හා සමගාමීව නීතිය බලාත්මක කරනු ලබන ත්‍රිවිධ හමුදා සහ පොලීසිය යන ආයතනයන්හි නිළධාරින් ඉලක්ක කර ගනිමින් නිවාරණ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි. ඕනෑම ආයතනයක් තම සේවකයින් තුළින් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් බලාපොරොත්තු වන අතර මත්ද්‍රව්‍ය භාවිතය මගින් සේවකයින් හට තමාගෙන් ආයතනය බලාපොරොත්තු වන එකී සේවාව සැපයීමට නොහැකි තත්ත්වයක් උදා කරන අතර එය වර්තමානය වන විට විශාල වැඩබිම් ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළුවකි. එම නිසාම නිවාරණ දැනුවත් කිරීම් හි අවශ්‍යතාවය දැඩිව දැනෙන කාරණයක් වන අතර අප අංශය මගින් එකී අවශ්‍යතාවය ඉටු කරනු ලබයි.












එසේම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය තම නිවාරණ දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් දහම් පාසල් සිසුන්, දෙමාපියන් , විවිධ ප්‍රජා කණ්ඩායම් ,රාජ්‍ය නිළධාරීන් සහ පාසල් ගුරුවරුන් ඉල්කක කොට ගනිමින් සිදු කරනු ලබයි. එසේම මෙම කාර්තුව තුළ පොලිස්පතිතුමාගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය මැඩලීම සදහා වන වැඩපිළිවෙළ යටතේ මත්ද්‍රව්‍ය භාවිතය සදහා ඇබ්බැහි වූ පුද්ගලයින් ඉලක්ක කොට ගනිමින් සිදු  කරනු ලැබූ ,සුවසාර කැදැල්ල, ප්‍රතිකාර සහ පුනරුත්ථාපන කඳවුරුවල සේවාලාභීන් සදහා උපදේශන සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සදහා දායකත්වය ද ලබා දෙන ලදී.













ඒ අනුව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2024 ජුනි මස අවසානය වන විට තම වාර්ෂික ඉලක්කයන්ට අදාළව  පාසල් පාදක නිවාරණ වැඩසටහන් යටතේ ,පාසල් සිසුන් දැනුවත් කිරීමට අදාළව වැඩසටහන් 230 ක් සිදු කර ඇති අතර එය වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව 28.75 ප්‍රගතියක් වන අතර අන්තර්ජාතික පාසල් සිසුන් දැනුවත් කිරීමට අදාළව 20 ක ප්‍රගතියක් හා දෙමාපියන් දැනුවත් කිරීමට අදාළව 28.50 ක ප්‍රගතියක් ජුනි මස අවසානය වන විට ළගා කර ගෙන ඇත. එසේම පාසල් ගුරුවරුන් දැනුවත් කිරිමට අදාළව 36.67 ක ප්‍රගතියක් ළගා කොට ගෙන ඇත.
තරුණයින් පාදක කොට ගත් නිවාරණ වැඩසටහන් යටතේ තරුණයින් පාදක කොට ගත් අධ්‍යාපනික වැඩසටහන්හි ප්‍රගතිය 78 ක් ලෙස සහ තරුණයින් ඉලක්ක කොට ගත් පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධව 65 ක ප්‍රගතියක් අත් කොට ගෙන ඇත.විශ්ව විද්‍යාල සිසුන් ඉලක්ක කොට ගත් නිවාරණ වැඩසටහන්හි ප්‍රගතිය ජුනි මස අවසාන වන විට 88 ක ප්‍රගතියක් ළගා කර ගෙන ඇත.
 පවුල් පාදක නිවාරණ වැඩසටහන්හි වාර්ෂික ඉලක්කය වැඩසටහන් 100  ක් වූ අතර එම ඉලක්කයට අදාළව වැඩසටහන් 53 ජුනි මස අවසානය වන විට සිදු කර ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 53 කි. විශාල වැඩබිම් පාදක නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්හි වාර්ෂික ඉලක්කය වැඩසටහන් 100 ක් වූ අතර ඉන් වැඩසටහන් 52 ජුනි මාසය වන විට අවසන් කර ඇති අතර එය 52 ක ප්‍රගතියකි. ප්‍රජාපාදක නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්හි වාර්ෂික ඉලක්කයෙන් 52 ප්‍රගතියක් ජුනි මස වන විට ළගා කර ගෙන ඇති අතර සමස්ථයක් ලෙස නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය  තම වාර්ෂික ඉලක්කයෙන් වැඩසටහන් ප්‍රමාණය අනුව 42.13 ක ප්‍රගතියක් සහ වැඩසටහන් සඳහා සහභාගි වූ ප්‍රමාණය අනුව ගත් කළ 32.40 ක ප්‍රගතියක් ළගා කොට ගෙන ඇති බව සඳහන් කළ හැකිය.

## පර්යේෂණ අංශය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය විසින් මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. ලංකාවේ සියලුම පොලිස් ස්ථාන හරහා මෙම දත්ත පද්ධතියට දත්ත ලැබෙන අතර අන්තරායකර ඖෂධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා පුද්ගලයින්ගේ තොරතුරු ඇතුළත් කරනු ලැබේ.  මෙම දත්ත පද්ධතියට ලබා දෙන දත්ත වල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු මතුව ඇති බැවින් එම ගැටලු වළක්වාගෙන ගුණාත්මක දත්ත ගෙන්වා ගැනීමට පොලිස් බල ප්‍රදේශ මට්ටමින් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා පර්යේෂණ අංශය එක්ව පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කරන ලදි.

ඒ අනුව සබරගමුව පළාතේ කෑගල්ල, සීතාවකපුර, රත්නපුර සහ ඇඹිලිපිටිය පොලිස් කොට්ඨාශ නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් දෙකක් 2024.06.26 සහ 28 යන දිනයන්හිදී පවත්වන ලදි. ඒ

සඳහා සබරගමුව පළාතේ සියලුම පොලිස් ස්ථාන වල දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපතිවරුන් සහ වී පී එන් රාජකාරියේ නිරත නිලධාරීන් 120 දෙනෙකු සහභාගි විය.
එහිදී විද්‍යාත්මක සාක්ෂි මත පදනම් ව මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නව ප්‍රවණතා පිළිබඳ පුහුණු වැඩසටහන හරහා නව මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම, මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ ගෝලීය තත්වය සහ ලංකාවේ තත්ත්වය, මත්ද්‍රව්‍ය ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීම සහ පවතින නීති පද්ධතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කරන ලදි.







## 2024 වර්ෂයේ බාහිර සේවා අංශය විසින් පවත්වනු ලැබූ විශේෂ වැඩසටහන

රාජ්‍ය වෙසක් මහෝත්සවයට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන මාතලේ අළුවිහාරය සහ තවත් බෞද්ධාගමික විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් දින දෙකක් පුරා පවත්වන ලදී.

මෙවර රාජ්‍ය වෙසක් උත්සවයේ තේමාව බවට පත් වූ "අනුන් කළ දේ නොව තමන් කළ දේ පිළිබඳ විමසිලිමත් වෙමු"  යන තේමාව පාදක කරගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදී.

වෙසක් පොහොය නිමිති කර ගනිමින් බෞද්ධ දර්ශනය මත පදනම්වූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් මාලාවක් දහම් දිවයිනේ විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාසල් සිසුන් සහ ගුරුභවතුන් ඉලක්ක කරගෙන පවත්වන ලදි.






2024 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව ජාතික වෙත්සක් සතියේ තේමාව වන "අනුන් කළ දේ ගැන නොව තමන් කළ දේ පිළිබඳ විමසිලිමත් වෙමු"ල යන්න කුළුගන්වමින් දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ විහාරස්ථාන ආශ්‍රිතව මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩ ඇතුළත් බැනර් ප්‍රදර්ශනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කටයුතු කරන සංවර්ධන නිලධාරීන් විසින් විවිධ බාහිර ආයතනවල දායකත්වයෙන් මෙම වැඩසටහන දියත් කරන ලදී.





බෞද්ධ දර්ශනය පාදක කරගත් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ පුහුණු වැඩසටහනක් අන්තරායකර ඖෂධ පාලක ජාතික  මණ්ඩලයේ බාහිරසේවා අංශය විසින් සංවිධානය කරන ලදී.  දින දෙකක් තුළ පැවති මෙම පුහුණු වැඩසටහන සඳහා විවිධ ප්‍රදේශවල ශාසනාරක්ෂක බල මණ්ඩල නියෝජනය කරමින් දහම් පාසල් ගුරුවරුන් 400 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි වන ලදී. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති නීතිඥ ශාක්‍ය නානායක්කාර මැතිතුමන් විසින් වැඩසටහන මෙහෙයවන ලදී.






**ශ්‍රී පාද වන්දනා කිරීමට පැමිණෙන බැතිමතුන් වෙනුවෙන් පවත්වන ලද වැඩසටහන**

සෑම වසරකම මෙන්ම මෙම වසරේදීත් ශ්‍රී පාද පූජා භූමිය වෙත පැමිණෙන ජනතාව ඉලක්ක කර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ දැනුවත් කිරීමේ වැඩසටහනක් මධ්‍යම පළාත් බාහිරසේවා නිලධාරීන් විසින් පවත්වන ලදී





**නුවරඑළිය වසන්ත සැණකෙලිය වෙනුවෙන් පවත්වන ලද වැඩසටහන**

සෑම වසරකම පැවැත්වෙන නුවරඑළිය වසන්ත සැණකෙලිය සඳහා පැමිණෙන ජනතාව වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී






මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා ප්‍රජාපාදක ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද කෙටිකාලීන නේවාසික ප්‍රජාපාදක ප්‍රතිකාර කඳවුරු වැඩසටහනේ පළමු අදියර කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් ස්ථාන 11කදී සාර්ථකව පවත්වා අවසන් කරන ලදී.

ශ්‍රී ලංකා පොලිසිය විසින් මෙම ප්‍රතිකාර වැඩසටහන සංවිධානය කරන ලද අතර සියලු පහසුකම් සහ අනෙකුත් අවශ්‍යතා පොලිසිය විසින් සම්පාදනය කරන ලදී.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තාක්ෂණික නිලධාරීන් විසින් ප්‍රතිකාර වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර දින 14ක නේවාසික ප්‍රතිකාර කාලසීමාවෙන් පසුව සුවවීමේ කණ්ඩායම් හරහා අදාළ පුද්ගලයින් විධිමත් පසුරුකවරණ ක්‍රියාවලියකට ලක් කර නැවත සමාජගත කිරීම සිදුකරනු ලබයි.

ස්ථාන 11ක් ආශ්‍රිතව ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ අතර එහි අවසන් විසිරයාමේ අවස්ථාව 2024.05.22 වන දින බස්නාහිර පළාත් නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේදී පොලිස්පතිතුමාගේ සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.







හොන්නන්තර ධර්මසේන ආටිගල බාලිකා විද්‍යාලයේ දී පැවති කැස්බෑව නගර සභාව විසින් සංවිධානය කරන ලද "ගමයි සභාවයි" ජංගම සේවා වැඩසටහන යටතේ අන්තරායකර ඔෟෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා අංශය සම්බන්ධ වෙමින් සිදුකරන ලද නිවාරණ සහ ප්‍රතිකාර සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන.







**"Better place for better work"**

Outreach unit of the NDDCB has initiated a prevention campaign at larger work places in collaboration with different sector agencies with the objective of creating a safe and better environment for productive outcomes.

As part of the prevention campaign, a interactive prevention program was conducted for the workers at the Uswatta Food Confectionary PVT Ltd, Millaniya.







**Implementation of 14 days of community-based treatment camps under the program of Community-based rehabilitation –**
**In collaboration with the Department of Police**
**1st stage in Colombo district (11 Camps)**

Recognizing the pressing need for comprehensive rehabilitation services for individuals struggling with substance abuse, the Outreach Unit has prioritized the establishment of these treatment camps as part of its commitment to community-based rehabilitation (CBR) efforts. The program is strategically designed to operate within the framework of the Outreach Unit's broader mission, leveraging its resources, expertise, and community networks to address the multifaceted challenges of drug addiction. By implementing these treatment camps within the annual action plan, the Outreach Unit aims to synergize its efforts with other initiatives and maximize the impact of its interventions in combating substance abuse within local communities.

Through collaboration with law enforcement agencies, local stakeholders, healthcare providers, and community leaders, the Outreach Unit seeks to mobilize collective action in support of individuals struggling with drug addiction. By fostering partnerships and engaging community members as active participants in the rehabilitation process, these treatment camps represented

an effective approach to addressing substance abuse while promoting social cohesion, resilience, and inclusivity.

The implementation of 14-day community-based treatment camps for drug users underscores the Outreach Unit's commitment to holistic and community-driven approaches to rehabilitation. By integrating medical care, counseling, peer support, and skill-building activities, these camps aim to provide a supportive environment for individuals on the path to recovery, empowering them to reclaim their health, dignity, and place within society.

From May 8th to May 22nd, 2024, 11 treatment camps were conducted in collaboration with the Sri Lanka Police across 11 selected locations in Colombo. These camps offered a comprehensive treatment package that included educational programs, counseling, motivational interviewing, cognitive behavioral therapy, vocational guidance, TB and HIV screening, entertainment programs, spiritual programs, and a wide range of treatment interventions.

The 14-day treatment program at the camps was designed to provide a holistic and multifaceted approach to support drug users in their recovery journey. Each day was structured to include various activities and sessions that catered to different aspects of recovery and personal development. The main priority was given to challenging participants' expectations about drug use and fostering a real understanding of its consequences. By prioritizing the challenge of drug use expectations and promoting a real understanding of drug use, the program aimed to equip participants with the knowledge, skills, and support necessary for sustainable recovery.

Over the 14 days, drug users participated in these programs and were subsequently referred to follow-up mechanisms through recovery groups, each comprising 10 individuals. These groups provided ongoing support and accountability, helping participants maintain their progress and continue their recovery journey.

| No | Location of the Treatment camps | Number of participants |
|---|---|---|
| 1. | **Sri Sambudhdaloka Daya Viharaya, Maradana** | **46** |
| 2. | **Akbar Muslim Mosque – Col 02** | **26** |
| 3. | **Sri Vijayaramaya - Wellawatta** | **43** |
| 4. | **Abhayarama Viharaya - Narahenpita** | **30** |
| 5. | **Wickramasinharamaya - Dematagoda** | **57** |
| 6. | **Sinhala Vidyalaya, Mihindu Mawatha - Keselwatta** | **43** |

| | | |
|---|---|---|
| 7. | Paramananda Viharaya - Kotahena | 48 |
| 8. | Siththi Vinayagar Kovila – Col 13 | 48 |
| 9. | Mariya Vidyalaya - Mattakkuliya | 50 |
| 10. | Kadirestion Kovila – Col 04 | 28 |
| 11. | Muslim Mosque – Col 12 | 26 |








**Prevention campaign at Anuradhapura parallel with the International Day against drug abuse and illicit trafficking**

Aligned with the International Day Against Drug Abuse and Illicit Trafficking 2024, Anuradhapura launched a multifaceted prevention campaign aimed at diverse segments of the community, ensuring widespread impact and engagement. The campaign featured specialized prevention programs for government officials from various agencies, recognizing their influential role in policy implementation and community leadership. Workshops tailored to these officials focused on enhancing their knowledge of drug abuse issues, equipping them with the necessary tools to identify and address drug-related problems within their jurisdictions effectively. These sessions encouraged inter-agency collaboration, fostering a unified approach to combating drug abuse at the administrative level.

Parallel to this, targeted interventions were conducted for students of technical colleges, a group particularly vulnerable to drug use due to academic pressures and social influences. The programs included interactive seminars, peer-led discussions, and mentorship opportunities, aimed at promoting a drug-free lifestyle and building resilience against substance abuse. By engaging students in meaningful conversations and activities, the campaign sought to empower them with the knowledge and confidence to make informed choices. Additionally, an awareness program was conducted for the prison inmates of the Anuradhapura prison.

A significant highlight of the campaign was the mobile awareness initiative, which brought the message of drug prevention directly to urban communities and local sellers. Equipped with informational materials and led by volunteers and health professionals, the mobile units traveled through neighborhoods, and marketplaces, engaging residents and shop owners in discussions about the dangers of drug abuse. This grassroots approach ensured that the campaign's reach extended to the most accessible and often overlooked sections of society. By addressing drug abuse on multiple fronts - government, education, correctional facilities, and the broader community the Anuradhapura prevention campaign aimed to create a comprehensive and sustainable impact in the fight against illicit drugs.







# NDDCB ප්‍රතිකාර මධ්‍යස්ථාන



## Kandy

"Kandy" Youth Prevention,
Treatment& Rehabilitation Centre
Mampitiya Estate Handessa,
Peradeniya
Tel : +94 81 2315504




## Nawadiganthaya

"Nawadiganthaya" Prevention,
Treatment & Rehabilitation Centre
Urapola, Nittambuwa
Tel : +94 33 2283060
Fax : +94 33 2283060
Email : navadiganthaya@nddcb.gov.lk



## Talangama

"Talangama" Prevention, Treatment &
Rehabilitation Center
172, Shanthi Mawatha, Talangama
Tel : +94 11 2788090
Fax : +94 11 2788090
Email : sethsevana@nddcb.gov.lk



## Galle

"Galle" Prevention, Treatment &
Rehabilitation Centre
Unawatuna Galle
Tel : +94 91 2224443
Fax : +94 91 2224443
Email : mithsevana@nddcb.gov.lk